**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ ආදායම් ගිණුම් තැබීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ජංගම නොවන වත්කම් විකුණුම් මගින් ලැබූ රු.794,096 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ නොදක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | ජංගම නොවන වත්කම්වල විකුණුම්, ආදායම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව නිවැරදිව දැක්විය යුතුය. | භාණ්ඩාගාරයෙන් නිසියාකාර මාර්ගෝපදේශයන් ලබා නොදීම නිසා ඔබගේ උපදෙස් සැලකිල්ලට ගෙන ඉදිරියේදී අප හට නිවැරදි ක්‍රියාපිළිවෙත් අනුගමනය කළ හැකි බව දන්වා සිටිමු. |

**(ආ) පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම් තැබීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන වියදම්වල වැඩසටහන් 02 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් දෙකේ මුළු වියදම්වල එකතුව වැය විෂයයක් ලෙස දැක්වීම නිසා භාණ්ඩාගාරයේ මුද්‍රිත සටහන් සමඟ සැසඳීම් සිදුකළ නොහැකි වී තිබුණි. | වැඩසටහන් 02 ක් වන බැවින් වැය විෂයයන් ද වැඩසටහන් ආකාරයට වෙන වෙනම දැක්විය යුතුය. | ඉදිරියේදී භාණ්ඩාගාරය ඉහත වැඩසටහන් පදනම්ව ගිණුම් ප්‍රකාශ පිළියෙල කර ලබාදෙන ලෙස ඉල්ලීම් කළ විට ලබාදුන් ආකාරය පදනම් කරගනිමින් ගිණුම් ප්‍රකාශ ලබාදෙනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඇ) රජයේ නිලධාරීන් සඳහා වූ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (i) | විගණනයට ඉදිරිපත් කළ සමාලෝචිත වර්ෂයට අදාළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ප්‍රකාශයේ 2018 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිටව තිබූ සේවය අත්හිටවූ විශ්‍රාම ගිය සහ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරුවීම් ලබාගිය නිලධාරීන්ගේ වටිනාකම එකතුව රු.මිලියන 1.87 ක් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර ස්ථාන මාරුවීම් ලබාගිය නිලධාරීන්ගේ ණය 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 01 ඡේදයේ සඳහන් විධිවිධාන අනුගමනය කර නිලධාරියා ස්ථාන මාරුවීම් ලබා ගොස් මාස 03 ක් ඇතුළත නිරවුල් කළ යුතුය. එලෙසම පළාත් සභාවලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන්ගේ හිඟ ණය එම චක්‍රලේඛයේ 03 ඡේදයේ විධිවිධාන අනුව නිරවුල් කළ යුතුය. එලෙස නිරවුල් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිශ්ෂ්ඨයේ 8.1 සහ 8.2 වගන්ති අනුව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉහත චක්‍රලේඛයේ 8 ඡේදයේ සඳහන් කර ඇත. ඒ අනුව කටයුතු කළ යුතුය. ණය මුදල් ආපසු ගෙවා අවසන් කිරීමට පෙර විශ්‍රාම යන හෝ මරණයට පත්වන හෝ සේවය අවසන් කරන නිලධාරියෙකු හෝ රාජ්‍ය සංස්ථාවකට මුදාහරින නිලධාරියෙකුගේ ණය ශේෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිශ්ෂ්ඨයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. | විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් ලැබිය යුතු මුදල් විශ්‍රාම පාරිතෝෂිකයෙන් ගැලපීමට අවසරය ලැබූ වහාම ගැලපීමට කටයුතු කරනු ලැබේ. අනෙකුත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරුවීම් ලබාගිය නිලධාරීන් පිළිබඳ ඉල්ලීම් ඉහත සඳහන් අමාත්‍යාංශයට යවා නිරවුල් කිරීමට කටයුතු කෙරේ. සේවය අත්හිටවූ නිලධාරියාගෙන් ලැබිය යුතු අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. පළාත් සභාවට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශයෙන් රු.201,250 ක් ගැලපීම් කර ඇත. අදාළ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන සලසා නොමැති බැවින් සමාන වාරිකවලින් අපහට මාසිකව ගෙවනු ලැබේ. |
| (ii) | එකතුව රු.894,360 ක ආපදා ණය නිසි ඇපකරුවන් නොමැතිව ලබා දී තිබූ බව | ණයවලට අදාළ ඇපකරුවන් ආයතන සංග්‍රහය ප්‍රකාරව තෝරා ගත යුතුය. | ඇපකරුවන් මාරු කිරීමට කටයුතු කර ඇත. |

නිරීක්ෂණය විය.

**(ඇ) දේපල, පිරියත හා උපකරණ**

**------------------------------**

දේපල, පිරියත හා උපකරණ සමීක්ෂණය කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වලිකාමම් බටහිර සහ වඩමාරච්චි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම්වල වටිනාකම පිළිවෙලින් රු.මිලියන 3.5 ක් සහ රු.මිලියන 35 ක් වශයෙන් තක්සේරු කර තිබුණත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.මිලියන 38.5 කින් අඩුවෙන් දක්වා තිබුණි. | තක්සේරු කළ ඉඩම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | තක්සේරු දෙපාර්තමේන්තුවේ ඉඩම් තක්සේරු කිරීම් සම්බන්ධ ලිපිය වාර්ෂික ගිණුම් අවසන් දිනය 2018.12.31 න් පසුව ලැබී තිබූ බැවින් 2018 වර්ෂයට අදාළ ගිණුම්වල ඇතුළත් කළ නොහැකි විය. |
| (ii) | කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම පෞද්ගලික අයකුට අයත්ව තිබුණද එහි වටිනාකම රු.මිලියන 02 මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම්වල දක්වා තිබුණි. එසේම මෙම ඉඩමේ කාර්යාල ගොඩනැගිල්ල රු.මිලියන 58.144 ක වටිනාකමින් ඉදිකර තිබුණද ඉඩමේ අයිතිය පවරා ගැනීමට 2019 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා ගැනීමට කටයුතු කල යුතුය. | තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක JN/LE/248 දරන 2012.07.17 දිනැති ලිපිය ප්‍රකාරව ඉහත ඉඩම රු.මිලියන 02 ක් වටිනා බව තක්සේරු කර තිබුණි. ඉහත වටිනාකම කාර්යාල අවශ්‍යතා පදනම් කරගනිමින් යෙදිය හැකි බව දැන්වූ නිසා මේ මත ඉහත වටිනාකම 2018 ගිණුම්වල ඇතුළත් කරන ලදී. ඉඩමේ අයිතිකරු හඳුනා ගත නොහැකි වී ඇත. ඒ අනුව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට ඉහත අයිතිවාසිකම් දක්වා නොමැති ඉඩම පවරා ගැනීම සඳහා ඉල්ලීම් ලිපිය යවා ඇත. |

**(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**--------------------------------------------**

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පහත සඳහන් ඇතැම් ලේඛන පවත්වා ගෙන නොමැති අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයේදී හෙළිදරව් විය. විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ------------------------ |
| (i) | **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය**<br>------------------------------ | | |
| | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් කර ඇති පරිදි රජයේ ගොඩනැගිලිවල ඇති සියළුම විදුලි උපකරණ පිළිබඳ භාණ්ඩ ලේඛනයක් පවත්වාගත යුතුය. | විධිමත් ආකාරයට පවත්වා ගෙන යාමට අප විසින් කටයුතු යොදා ඇත. |
| (ii) | **වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය**<br>------------------------------ | | |
| | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඔබ විසින් සඳහන් කළ ලේඛනය යාවත්කාලීන කර ලේඛනගත කිරීමට කටයුතු කර ඇත. |

**(ඊ) නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

--------------------------------------------------

නියැදි විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| ----------------------- | | | | ----------- | ---------------- |
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| ----------------------- | | ------------ | -------------------- | | |
| | | රු. | | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------- | | | | | |
| - | මුදල් රෙගුලාසි 371(2) | 3,670,317 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වලිකාමම් උතුර සහ වඩමාරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භාණ්ඩ හා සේවාවන් ලැබීමට | ප්‍රසම්පාදන පටිපාටින් අනුගමනය කළ යුතුය. | සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ප්‍රසම්පාදන පටිපාටින් අනුගමනය කර |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | පෙර අනුමත සමිතිවලට අතුරු අග්‍රිම අත්තිකාරම් ලබා දී තිබුණි. | | කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| - | මුදල් රෙගුලාසි571 | 4,352,478 | වර්ෂ 02 ක් ඉක්ම වූ ඇප තැන්පතු පිළිබඳ කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | Fine Aluminum (Pvt) Ltd. ඇප මුදල් වන රු.21,371 ක් 2019 අප්‍රේල් 11 දින නිරවුල් කරන ලදී. SSR Construction හි ඇප මුදල් රු.4,331,107 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ඇත. අත්හිටවූ වැඩසටහන දැන් නැවත පටන් ගැනීමට කටයුතු කර ඇත. |
| - | මුදල් රෙගුලාසි 137 හා 138 | 146,861 | 2018 වර්ෂය සඳහා වූ භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමට ප්‍රථම චෙක්පත් 148 ක් ලියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක් විසින් ආරක්ෂිතව තබා තිබුණි. මෙම චෙක්පත් 2019 මාර්තු 31 දින වන විටත් භාණ්ඩ ලබා නොගත් මාරු නොකළ චෙක්පත් ලැයිස්තුවේ දක්නට විය. | මුදල් රෙගුලාසි 137 හා 138 ප්‍රකාරව භාණ්ඩ හා සේවාවන් ලබාගත් පසුව චෙක්පත් ලිවිය යුතුය. | භාණ්ඩ හා සේවාවන් ඉක්මනින් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. |
| - | මුදල් රෙගුලාසි 113 | 2,403,000 | වර්ෂ 17 ක සිට 31 දක්වා පරාසයක කාලයක සිට විවිධ කාරණා හේතුවෙන් එකතුව රු.මිලියන 2,403 ක් වූ පසු මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව ගිණුම්වල නොගැලපීම් සිදුකර හෙළිදරව් කිරීමට අවශ්‍ය | මුදල් රෙගුලාසි 113 අනුව කටයුතු කළ යුතුය. | පාඩු රු.16,016,958.75 ක් සහ සංගානෙයි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය රු.459,850 ක් කපා හැරීමට අනුමැතිය අමාත්‍යාංශයෙන් ලැබී නොතිබුණි. |

ක්‍රියාමාර්ග නොගෙන මූලාා ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) **වංචනික ස්වරූපයෙන් වූ ගනුදෙනු**

නියැදි විගණනය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයෙන් ගනුදෙනු සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | බන්ධනාගාර ප්‍රතිසංස්කරණය පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍යාධාරයෙන් වලිකාමම් නිරිත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඉදිකල මනිප්පායි වෙලඳපොළ ගොඩනැගිලි සංකිර්ණය ඉදිකිරීම් කාර්යයේ ගෙවීම් වලින් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදි එකඟ වූ අඩුකිරීම් අදාල අනුපාත අනුව අයකර නොතිබු නිසා රු.348,998 ක් වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි. | අදාල වැඩියෙන් සිදුකල ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉටු කළ කොන්ත්‍රාත්කරුගෙන් වැඩියෙන් ගෙවනු ලැබු වටිනාකම අයකිරීම සඳහා කටයුතු යොදා ඇත. |
| (ii) | දිවයින දකුණ වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිලාභීන් පවුලේ සාමාජිකයන්ගේ ගණන සත්‍ය සංඛ්‍යාව පටහැනිව වැඩිකර දැක්වීම නිසා රු.66,000 ක් වටිනා වියලි ආහාර මළු වැඩියෙන් ලබා දී තිබුණි. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකොට සම්බන්ධිත නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ XLVII පරිශිෂ්ඨයේ විධිවිධාන ප්‍රකාරව විනය ක්‍රියා මාර්ග ගත යුතුය. | සහානාධාර ලබා දීමේදී සාමාජික සංඛ්‍යාවේ සුළු වෙනස් විමක් ඇති වී ඇත. එසේ වුවත් සඳහන් වූ පවුල් වලට පමණක් සහනාධාර ලබා දි තිබුණි. |
| (iii) | ශීඝ්‍ර ගම්මාන සංවර්ධන වැඩසටහන (ගම්පෙරළිය) යටතේ වඩමාරච්චි උතුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සාලම්බෙයි වියාපාරමූලෙයි මාර්ගය ප්‍රතිසංස්කරණ කාර්යය සඳහා තාක්ෂණික නිලධාරී විසින් සිදුකල තක්සේරුවට වඩා අමුද්‍රව්‍ය 03 ක් සත්‍ය වශයෙන් ලබා දී තිබූ අමුද්‍රව්‍ය අඩුවෙන් තිබූ බැවින් එකතුව රු.115,169 ක් වැඩියෙන් ගෙවීම් | මේ සම්බන්ධයෙන් අදාල විමර්ශන ක්‍රියාත්මක කර වැඩියෙන් සිදුකල ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පිලිතුරු ලබා දී නැත. |

කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ශීර්ෂය 120 හි පුනාවර්තන වියදම්වලින් රු.මිලියන 11.46 ක් වටිනා ව්‍යාපෘති කාර්යයන් අවසන් කර තිබුණි. නමුත් භාණ්ඩාගාරයෙන් සමාලොචිත වර්ෂය සඳහා අග්‍රිම මුදල් නොලැබු බැවින් ඒ සඳහා වූ ගෙවීම් සිදුකල නොහැකි වී තිබුණි. | අග්‍රිම අදාල කාලය තුළ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සියල්ල 2019 ජනවාරි මාසයේදී මුළුමනින්ම නිරවුල් කර ඇත. |
| (ආ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල මුලධන වියදම්වලින් අවස්ථා 12 කදි වැය විෂයයන් 10 ක් යටතේ එකතුව රු.මිලියන 636.80 ක් වටිනා ව්‍යාපෘති කාර්යයන් නිමකර තිබුණි. එසේ වුවද, භාණ්ඩාගාරයෙන් සමාලෝචිත වර්ෂය සඳහා අග්‍රිම මුදල් නොලැබීම නිසා ඒ සඳහා වූ ගෙවීම් සිදුකළ නොහැකි වී තිබුණි. | වියදම් සිදුකිරීමට ප්‍රථම අග්‍රිම ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුයි. | අපගේ ඉල්ලීමට වඩා අඩු මුදලක් භාණ්ඩාගාරයෙන් නිදහස් කර තිබූ බැවින් 2018 වර්ෂය අවසාන කාලපරිච්ඡේදයේ භාණ්ඩ, සේවා සහ කාර්යයන් යනාදිය ඉටුකරනු ලැබූ සැපයුම්කරුවන්ටත්, කොන්ත්‍රාත්කරුවන්ටත් ගෙවීම් සිදු කළ නොහැකි තත්ත්වයක් උද්ගත වි ඇත. |

### 2.2 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම්, මූල්‍ය ප්‍රතිපාදන මාරුකිරීම්, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම් සහ උපයෝජනය ඉතිරිකිරීම් පිලිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පුනරාවර්තන වියදම්වල මූලික ප්‍රතිපාදනයෙන් වැය විෂයයන් 12 ක සියයට 07 සිට සියයට 54 දක්වා පරාසයක ඉතිරි කිරීම් එකතුව රු.මිලියන 17.22 ක් පැවැතුණි. | අයවැය මුළුමනින්ම උපයෝජනය කිරීමට කටයුතු කළයුතුයි. | ඉදිරි කාලයේදි විශාල පරාසයක වෙනස් වීම් අවම කිරීමට අප විසින් කටයුතු කරනු ලැබේ. |
| (ආ) | පුනරාවර්තන වියදම්වල වැය විෂයයන් 12 ක සියයට 05 සිට සියයට 2333 දක්වා පරාසයක එවැනිම එකතුව රු.මිලියන 17.22 කින් වැඩිවීම් ඇති වී තිබුණි. මෙය පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තු | අයවැය සම්පූර්ණයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | අයවැය මත පදනම්ව මතු වූ සාධාරණ ඉතිරිකිරීම් වලින් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ වැය විෂයන්වලට මාරු කිරීමට ගණන්දීමේ නිලධාරී විසින් |

| | | | |
|---|---|---|---|
| | නිසි සැලැස්මකින් තොරව වෙන්කිරීම නිරූපනය කෙරේ. | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට ඉදිරිපත් කළ පැහැදිලි කිරීම් පිලිගැනීම පදනම් කරගනිමින් හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවරායාත් භාණ්ඩාගාරයත් මුදල් රෙගුලාසි 66 (1) මාරු කිරීම් කටයුතු සඳහා අනුමැතිය ලබා දී තිබූ බව සඳහන් කෙරේ. |
| (ඇ) | පුනාවර්තන වියදම්වලින් මූලික ප්‍රතිපාදනවලින් වැය විෂයයන් 11 ක 07 සිට 54 දක්වා ප්‍රතිශතයක පරාසයකින් ඉතිරිවීම් පැවැති අතර මාරු කිරීම් සඳහා සතුටුදායක හේතු ඉදිරිපත් කර නොතිබුණි. | අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පමණක් මාරු කිරීම් කළ යුතුය. | ඉදිරි කාලයේදි විශාල පරාසයක වෙනස් වීම් අවම කිරීමට කටයුතු අප විසින් ගනු ලැබේ. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 48 ක් විසින් එකතුව රු.මිලියන 4,956.54 ක මූල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබුණි. එම මූල්‍ය ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 4,253.08 ක් වැයකර තිබුණි. රු.මිලියන 703.46 ක් හෙවත් සියයට 14 ක් සමාලෝචිත වර්ෂයේ උපයෝජනය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාරිමාර්ග ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක NDRSC/2018/03III දරන 2018 ඔක්තෝබර් 18 දිනැති චක්‍රලේඛයේ 10 ඡේදය ප්‍රකාරව සාමාජික සංඛ්‍යාවට අනුකූලව නියං සහනාධාර ලබා නොදීම නිසා ප්‍රතිලාභීන් 1033 දෙනෙකු වැනි සංඛ්‍යාවකට, පවුලකට රු.1000 බැගින් එකතුව රු.1,033,000 ක් වටිනා වියළි ආහාර මළු අඩුවෙන් දිවයින දකුණ වේලනෙයි, වලිකාමම් නිරිත, වඩමාරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් තහවුරු කළ යුතුය. | චක්‍රලේඛය පරිවර්තනයේදි සිදු වූ දෝෂය හේතුවෙන් අඩුවෙන් ලබාදී තිබුණි. මෙවැනි දෝෂ ඉදිරි කාලයේදී සිදු නොවන අයුරින් අප විසින් කටයුතු කරනු ලබන බව ඔබට කාරුණිකව දන්වා සිටිමු. |
| (ආ) | වඩමාරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ ග්‍රාම සංවර්ධන | ඇස්තමේන්තුවේ සඳහන් ආකාරයට 13A Plug Point සවිකිරිමට කටයුතු කළ | දැනට ඒවා මාරුකර සවිකිරීමට කටයුතු කෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | වැඩසටහන මගින් (ONUR) මැහුම්, තල් ආශ්‍රිත අත් වැඩ පුහුණු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට රු.මිලියන 4.25 ක් වැයකර තිබුණි. ඉන් මහන මැෂින් සඳහා විදුලිය ලබාදීම සඳහා 13A Plug Point වෙනුවට 15A Plug Point සවිකර තිබීම නිසා මහන මැෂින් ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි. | යුතුය. | |
| (ඇ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නියං සමයේ පානීය ජලය බෙදාහැරීම සඳහා වඩමාරච්චි දකුණ, බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබා දී තිබූ ට්‍රැක්ටර් ජල ටැංකිය පසුගිය මාස 18 ක් තිස්සේ අදාල අවශ්‍යතාවය සඳහා උපයෝජනය කර නොතිබුණි. (RY-1532) (WPRE-1083) | නියඟයෙන් හානියට පත් ජනතාවට පානීය ජලය ලබාදීමට අදාළ ජල බවුසරය භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය සභාව විසින් තමන්ට පවරා දෙනු ලැබුවහොත් භාවිතා කළ හැකි බව දන්වා ඇත. |
| (ඇ) | දිවයින දකුණ වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 සහ 2018 වර්ෂවල නිකරුනේ ගැවසෙන ගවයන් ඇල්ලීමට හා ඒවා රැගෙන යාමට රෝද දෙකේ ට්‍රැක්ටර් බර එසවීමේ වියදම් ලෙස රු.2,243,800 ක් ගෙවා තිබුණි. මෙම වියදම් සඳහා ගවයන් ඇල්ලූ පුද්ගලයාගේ නම, විස්තර, ගෙවීම් කළ බවට සාක්ෂි, රෝද දෙකේ ට්‍රැක්ටර, බර එසවීමේ යන්ත්‍ර ලියාපදිංචි අංක, පටවනු ලැබූ හා බැස්සනු ලැබූ දින, සත්ව ආහාර මිලදී ගැනීමේ ලදුපත් යනාදි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකළ නිසා එම වියදම් විගණනයේදී පිළිගත් බවට තහවුරු කළ නොහැකි විය. | මෙම වියදම් පිළිබඳ සියළුම ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | ඔබ විසින් සිදුකළ ඉල්ලීම් සියල්ල කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් නිවැරදිව විධිමත්ව ගොනුගත නොකිරීම නිසා විගණනයේදී ඉදිරිපත් කළ නොහැකි වී තිබුණි. |

**2.4 අත්තිකාරම් ගෙවීම් හා නිරවුල් කිරීම්**

අත්තිකාරම් ගෙවීම් සහ නිරවුල් කිරීම් පිළිබඳ හෙළිදරව් කළ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අවස්ථා 05 කදී ලබාදුන් අත්තිකාරම් එකතුව රු.149,500 ක් මාස 01 සිට මාස 04 | මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ලබාගත් අත්තිකාරම් දින 30 ක් ඇතුළත නිරවුල් කරන ලෙස සියළුම මාණ්ඩලික නිලධාරින් දැනුවත් කර ඇත. |

| | | |
|---|---|---|
| ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබූ බව නිරීක්ෂණය විය. | | එසේ වුවත්, අපගේ පාලනයෙන් බැහැරව පවතින කාරණා නිසා සිදුවන ප්‍රමාදයන් ඉදිරි කාලයේදී සිදු නොවන අයුරින් කටයුතු සිදුකරනු ලැබේ. |

**2.5 තැනපත් ශේෂ**

තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් හෙළිදරව් කරනු ලැබූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තෙවන පාර්ශවයට ආපසු ගෙවිය යුතු තාවකාලික තැන්පතුවල එකතුව රු.මිලියන 1.09 ක් මාස 06 කට අධික කාලයක සිට අදාළ පුද්ගලයන්ට ලබා නොදී තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි. | අදාළ තාවකාලික තැන්පතු මුදල් අදාළ පුද්ගලයන්ට ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය. | දැන් ඒවා නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | වියදම් ප්‍රේෂණය සඳහා ලැබී තිබූ එකතුව රු.මිලියන 25.28 කට අධික කාලයක සිට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | අදාළ අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | දැනට ඒවා නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | උතුරු පළාත් සභාවට අයත් 2018 දෙසැම්බර් 31 දිනට වූ ආදායම් ශේෂවල එකතුව රු.මිලියන 2.47 අදාළ අමාත්‍යාංශවලට හෝ දෙපාර්තමේන්තුවලට නොයවා තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | උතුරු පළාත් සභාවට අයත් ආදායම් නියමිත කාලයේ අදාළ දෙපාර්තමේන්තුවලට යැවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. | දැනට ඒවා නිරවුල් කිරීමට කටයුතු සලසා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මසම්බන්ධයෙන් සැලසුම් කිරීම හා හෙළිදරව් කරනු ලැබූ අනෙකුත් සැලසුම් පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එයට අනුව දිස්ත්‍රික් ලේකම් | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව | වර්ෂ අවසාන කාලපරිච්ඡේදයේ ඉහත මූල්‍ය ප්‍රතිපාදන ලැබී තිබූ බැවින් |

| | | |
|---|---|---|
| කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක් විසින් ඉටුකළ යුතුව තිබූ ගම්පෙරළිය වැඩසටහන් 408 කින් වැඩසටහන් 404 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ නිමකර තිබුණි. මෙම වැඩසටහන් සඳහා එකතුව රු.මිලියන 394.82 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබූ අතර ඉන් එකතුව රු.මිලියන 389.35 ක් උපයෝජනය කර තිබුණි. මෙම සලසා තිබූ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5.47 ක් ඉතිරි වී තිබුණි. | කටයුතු කළ යුතුය. | වැඩසටහන් නිසි අයුරින් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් කාලයක් නොමැති වූ බැවින් මූලා ප්‍රතිපාදන නැවත අමාත්‍යාංශයට ආපසු හරවා යවන ලදී. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වලිකාමම් නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.මිලියන 18.763 ක් වටිනා මනිප්පායි වෙළඳපොල ගොඩනැගිලි සංකීර්ණය හා සනීපාරක්ෂක පද්ධතිය ඉදිකර තිබූ නමුත් අදාළ අරමුණු සඳහා භාවිතා කර නොතිබූ අතර නීතිවිරෝධී ලෙස තරුණයන්ගේ විනෝදාස්වාදය සඳහා යොදාගෙන තිබූ බව නිරීක්ෂණය විය. මෙම කඩ කාමර සංකීර්ණය බදු දීම සඳහා කටයුතු නොකර පසුගිය මාස 10 ක කාලයක් නිෂ්කාර්යව තබා තිබූ බැවින් අපේක්ෂා කළ රු.500,000 ක ආදායම් ලබාගත නොහැකි වී තිබුණි. | වෙළඳපොල කඩ කාමර සංකීර්ණය බදු දීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. | කඩකාමර බදු දීම සහ ඵලදායී ලෙස ගොඩනැගිල්ල භාවිතා කිරීම පිළිබඳ මානිප්පායි ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ආ) | වලිකාමම් නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.මිලියන 10 ක වියදමින් ඉදිකළ එළවළු වෙළඳපොල වර්ෂයකට අධික කාලයක සිට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. මේ නිසා අපේක්ෂිත ආදායම් වන රු.350,000 ක් උපයාගත නොහැකි වී තිබුණි. | එළවළු වෙළඳපොල ව්‍යාපාරිකයන්ට බදු දීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | කඩ කාමර කුලියට දීම සහ ඵලදායී ලෙස ගොඩනැගිල්ල භාවිතා කිරීම පිළිබඳ මානිප්පායි ප්‍රාදේශීය සභාව විසින් කටයුතු කරමින් පවති. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකළ රු.මිලියන 4.56 ක් වටිනා විදුලි සෝපානය වාර්ෂික නඩත්තු වියදම් සඳහා රු.207,000 ක් වැයකර තිබුණි. එසේ වුවත්, ගිවිසුමේ සඳහන් ආකාරයට නඩත්තු සේවාවන් සිදු නොකිරීම නිසා නිරතුරුව ක්‍රියා විරහිතව මාස 02 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. මේ නිසා කාර්යාලයේ සේවය කරන අය සහ මහජනතාව අපේක්ෂා කළ ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබුණි. | නඩත්තු ගිවිසුමේ කොන්දේසි අනුව සේවා සපයනු ලබන අයගෙන් ඵලාදායී සේවාවක් ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුය. | නිරතුරුව ක්‍රියාවිරහිත වීමට හේතු වූ ඇතැම් කාරණා ඉහත සඳහන් ආයතන විසින් හඳුනාගෙන අප වෙත දැනුම් දී ඇත. ඉහත කාරණා සැලකිල්ලට ගෙන අනාගතයේදී ඉතා හොඳින් විදුලි සෝපායන ක්‍රියා කරවීමට කටයුතු කරනු ලැබේ. |

## 3.3 සැලසුම් නිමකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් වල කාල ප්‍රමාදයන් සිදු වී තිබුණි. විස්තර පහත දැක්වේ. | | |
| (i) | නිර්වේලි කෙසෙල් කැන් වගාකරුවන්ගේ සමුපකාර සමිති ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතුත්, කෙසෙල් වගා කිරීමේ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ කාර්යයන් සඳහා රු.10,223,189 ක් වැයකර තිබුණි. මෙම කාර්යයන් සියල්ල 2018 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර අවසන් විය යුතු වුවද 2019 ජුලි 31 දින වන විටත් ඒවා අවසන්ව නොතිබුණි. | ව්‍යාපෘතිය අදාළ කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුය. | ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර සහ පිරියත විදේශ රටකින් ආනයනය කර ලැබී ඇත. යන්ත්‍ර ස්ථාපිත කර එහි තාක්ෂණික වාර්තා ලැබීමෙන් පසුව අඛණ්ඩව මෙහෙයුම් කටයුතු තවදුරටත් අප විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| (ii) | කොන්ඩාවිල්හි විදුලියෙන් ක්‍රියාකරන යන්ත්‍ර ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහාත් අලුත් අත්‍යන්ත්‍ර ප්‍රසම්පාදනය සඳහාත් රු.14,009,992 වැයකර තිබූ අතර කර්මාන්තය 2018 දෙසැම්බර් 31 හෝ ඊට පෙර නිම කළ යුතු | ව්‍යාපෘතිය අදාළ කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුය. | ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර සහ පිරියත විදේශ රටකින් ආනයනය කර ලැබී ඇත. යන්ත්‍ර ස්ථාපිත කර එහි තාක්ෂණික වාර්තා ලැබීමෙන් පසුව අඛණ්ඩව මෙහෙයුම් කටයුතු තවදුරටත් අප විසින් |

| | | | |
|---|---|---|---|
| | වුවත් 2019 ජුලි 31 දින වන විටත් නිමකර නොතිබුණි. | | ක්‍රියාත්මක කරනු ලැබේ. |
| (iii) | තල් රා නිෂ්පාදනය සඳහා වර්ග 05 ක උපකරණ මිලදී ගැනීම සඳහා රු.5,521,610 ක් වැය කර තිබුණි. මෙම උපකරණ 2018 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර ලබාගත යුතු වුවත්, 2019 ජුනි 30 දින වන විටත් ඒවා සැපයුම්කරු විසින් සපයා නොතිබුණි. | ව්‍යාපෘතිය අදාළ කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුය. | අපගේ ඉල්ලීමට අනුව උපකරණ ලැබීමෙන් පසුව අපහට අඛණ්ඩව කටයුතු කළ හැකිය. |
| (iv) | යා/ ශාන්ත තෙරේසා බාලිකා විද්‍යාලය පන්ති කාමර ගොඩනැගිලි ඉදිකිරිම සඳහා රු.10,947,000 ක් වැය කර තිබුණි. මෙම කර්මාන්තය 2019 පෙබරවාරි 18 දින හෝ ඊට පෙර නිම කළ යුතු වුවත් 2019 ජුනි 30 දින වන විටත් නිම කර නොතිබුණි. | ව්‍යාපෘතිය අදාළ කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුය. | අපගේ ඉල්ලීමට අනුව උපකරණ ලැබීමෙන් පසුව අපහට අඛණ්ඩව කටයුතු කළ හැකිය. |
| (ආ) | වලිකාමම් නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මානිප්පායි වෙළඳපොල කඩ කාමර සංකීර්ණය (කඩ කාමර 20) ඉදිකිරීම සඳහා රු.මිලියන 18.76 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 23 දින නිම කළ යුතු වුවත් 2018 මැයි 18 දින එනම් දින 145 ක් ප්‍රමාද කර නිම කර තිබුණි. මේ සම්බන්ධයෙන් කාල ප්‍රමාදය සඳහා දඩ ගාස්තු රු.මිලියන 1.09 ක් කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 6.4 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය අදාළ කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුය. | කාල ප්‍රමාදය සඳහා ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | නල්ලූර් ප්‍රාදේශීය කාර්යාල පරිපාලන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීමේ අදියර I සඳහා රු.මිලියන 16.55 ක මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2018 ජුලි 31 දින නිම කළ යුතු වුවත්, 2018 ඔක්තෝබර් 21 දින වන විට 60% ක කාර්යයන් පමණක් කොන්ත්‍රාත්කරු විසින් නිම කළ තත්ත්වයෙන් දිස්ත්‍රික් ලේකම් පරිපාලනයෙන් 2018 ඔක්තෝබර් | ව්‍යාපෘතිය අදාළ කාලය තුළ නිමකිරීමට කටයුතු කළ යුතුය. | කාල ප්‍රමාදය සඳහා ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකිරීමට කටයුතු කර ඇත. |

21 දින කොන්ත්‍රාත් අවසන් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් මාස 03 ක කාල ප්‍රමාදය සඳහා රු.මිලියන 1.65 ක් කොන්ත්‍රාත් ගිවිසුම් 4.9.1 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි.

**3.4 ප්‍රසම්පාදනය**

**----------------**

මේ සම්බන්ධයෙන් හෙළිදරව් කරනු ලැබූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය<br>------------------------ | නිර්දේශය<br>---------------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------------- |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයුම් හා සේවාවන් ලබාගැනීම සඳහා රු.මිලියන 88.5 ක මුදල් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් ඉන් රු. මිලියන 88.5ක් වැය කර තිබුණි. සලසා තිබූ ප්‍රතිපාදන සම්බන්ධයෙන් පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලසුම් පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.<br><br>ප්‍රසම්පාදන සැලසුම් සහ ආරම්භක අවධිය<br>---------------------------------- | | |
| | මෙම අවධිය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සහ ලිපි ලේඛන පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ලිපි ලේඛන සකස් කර ඇමිණීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | ඔබගේ උපදෙස් හා මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන පැකේජයේ සාරාංශය, ආරම්භක ප්‍රසම්පාදන සැලැස්ම ආදිය 2018 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබයි. |
| (i) | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම | | |
| (ii) | ප්‍රසම්පාදන පැකේජයේ සාරාංශය | | |
| (iii) | ආරම්භක ප්‍රසම්පාදන සැලැස්ම | | |
| (iv) | හඳුනා ගනු ලැබූ ප්‍රසම්පාදනයන් සමඟ විශේෂ අනුමැතිය ලබාගැනීම. | | |
| (v) | නිර්දේශයන්, සැලසුම් කිරීම්, සටහන්, ඉදිකිරීම් ආදියෙහි සංවර්ධනය | | |
| (ආ) | පූර්ව කොන්ත්‍රාත් අවධිය<br>--------------------------- | | |

| | | | |
|---|---|---|---|
| | මෙම අවධිය යටතේ පිළියෙල කළ යුතු ලිපි ලේඛන සහ ව්‍යාපෘති පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ලිපි ලේඛන සකස් කර ඇමිණීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | ඇතැම් ලිපි ලේඛන සකස් කිරීමේ අවශ්‍යතාවය සහ අවස්ථාවන් ඇති නොවූ බැවින් ඒවා පිළියෙල කර නොතිබුණි. නමුත් 2018 වර්ෂයේ සිට ඒවා පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. |
| (i) | එක් එක් ගිවිසුම් පැකේජ, සහ ප්‍රසම්පාදන කාලසටහන | | |
| (ii) | කාර්යයන්, භාණ්ඩ සහ විස්තරාත්මක සේවා ප්‍රසම්පාදන සැලැස්ම | | |
| (iii) | උපදේශාත්මක සේවා සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුම් ඉහත සඳහන් පරිදි සැලසුම් සකස් කර නොතිබුණි. | | |
| (ඇ) | කොන්ත්‍රාත්වලින් පසුව අවධිය (කොන්ත්‍රාත් පරිපාලන අවධිය)<br>------------------------------------ | | |
| | මෙම අදියර යටතේ පිළියෙල කළ යුතු ලිපිලේඛන හා ව්‍යාපෘති පිළිබඳ නිරීක්ෂණ | | එක් එක් ප්‍රසම්පාදන පසු අවස්ථාවේදීම අප විසින් සම්බන්ධිත සියළුම ලිපි ලේඛන ගෙවීම් කිරීමේ අවශ්‍යතාවය සඳහා සකසනු ලැබේ. නමුත් ඇතැම් ලිපි ලේඛන සකස් කිරීමේ අවශ්‍යතාවය සහ අවස්ථාවන් ඇති නොවූ බැවින් ඒවා පිළියෙල කර නොතිබුණි. නමුත් 2018 වර්ෂයේ සිට ඒවා පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. |
| (i) | කොන්ත්‍රාත් පරිපාලන සැලැස්ම | | |
| (ii) | කොන්ත්‍රාත් පරිපාලන සැලැස්ම සමඟ සංයෝජිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉහත සඳහන් ආකාරයෙන් සැලසුම් සකස් කර නොතිබුණි. | | |

**3.5 වත්කම් කළමනාකරණය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජංගම නොවන වත්කම් නිෂ්කාර්යව සහ ඌන උපයෝජිතව පැවතුණි. විස්තර පහත දැක්වේ. | සම්පූර්ණයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | යතුරුපැදි වල අයිතිය පළාත් සභාව සතුය. මෙවාගේ අයිතිය මාරු කිරීමේ කාර්යයන් දිස්ත්‍රික් ලේකම් මඟින් සිදු කෙරේ. බෝට්ටු 06 ක් දැනට ප්‍රාදේශිය සභාව - වේලනෙයි වෙත පවරා දී ඇත. ආරක්ෂිත කබා 150 ක් ඌන උපයෝජිතව පැවතුණි. දැනට ප්‍රාදේශීය සභාව - වේලනෙයි වෙත භාර දී ඇත. |

| වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| | | රු. | වර්ෂ |
| ගොඩනැගිලි | 02 | 8.50 | 2-6 |
| යතුරු පැදි | 11 | 8.69 | 2-8 |
| බෝට්ටු | 06 | 1.24 | 2-4 |
| ආරක්ෂිත කබා | 150 | 0.44 | 2 |

**3.6 කළමනාකරණ දුර්වලතා**

මේ සම්බන්ධයෙන් හෙළිදරව් වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගම්පෙරළිය ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග ප්‍රතිසංස්කරණ කාර්යයන් සඳහා අත්තිවාරම් සඳහා ගොඩනැගිලි සුන්බුන් එම ප්‍රදේශයේම පවතින නමුත්, ඒ වෙනුවට Aggregate Base Course (ABC) යන අමුද්‍රව්‍ය භාවිතා කර තිබූ බැවින් වඩමාරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කළ මාර්ග 02 ක කර්මාන්ත සඳහා එකතුව රු.466,000 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. | කර්මාන්තයන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී ආර්ථිකභාවය සැලකිල්ලට ගත යුතුය. | ඉහත ව්‍යාපෘතිය ඉටුකළ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අයගෙන් පැහැදිලි කිරීම් ලබාගෙන ඒ සඳහා ක්‍රියාමාර්ග වහාම ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඉදිරිපස ස්වයංක්‍රීය දොර සවිකිරීම සඳහා 2016 වර්ෂයේදී රු.මිලියන 1.28 ක් වැයකර තිබූ නමුත්, ඉහත දොර මේ දක්වා අදාළ අවශ්‍යතාවය සඳහා භාවිතා කර නොතිබුණි. | මෙවැනි අනවශ්‍ය කාරණා වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉහත වැඩි වූ විදුලි වියදම් පාලනය කිරීමේ පරමාර්ථයෙන් පාලනයක් සහිතව ඉහත දොර අප විසින් භාවිතා කරනු ලැබේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

2018 දෙසැම්බර් 31 දිනට පැවති අනුමත කළ, තථ්‍ය, පුරප්පාඩු සහ අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 77 | 67 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 64 | 22 | 43 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 1721 | 1644 | 82 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 211 | 175 | 40 | 04 |
| | එකතුව | **2,073** | **1,808** | **175** | **10** |

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේ පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කළ සේවක සංඛ්‍යාව සුදුසු ආකාරයට පත්කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | අනුමත සේවක සංඛ්‍යාව අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු සම්බන්ධයෙන් අප විසින් විශේෂ අවධානය යොමු කර ඇත. නමුත් මේ දක්වා සම්බන්ධිත අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික මට්ටම්වල පැවති අතිරික්ත තනතුරු 10 අවශ්‍යතා පවතින ස්ථානවලට මාරු කිරීම සඳහා ක්‍රියාමාර්ග නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. | දැනට යාපනය දිස්ත්‍රික්කයේ සමස්තයක් වශයෙන් ගත් කළ පුරප්පාඩුව පවතී. නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තනි තනිව ගත් කළ අතිරික්තයක් පවතී. දිස්ත්‍රික්කයේ වෙබ් අඩවිය සහ නෙට් වර්ක් ඇතිකිරීම සඳහා තොරතුරු තාක්ෂණ සහකාරවරයෙකුගේ පුරප්පාඩුව තොරතුරු තාක්ෂණ නිලධාරී විසින් ආවරණය කර ඇත. කළමනාකරණ සහකාරවරුන් |

තිදෙනෙකුගේ අතිරික්තය දැන් නිරවුල් කර ඇත. (දෙදෙනෙකු උසස්වීම් ලබා පිටව ගොස් ඇති අතර නිලධාරියා මියගොස් ඇත.) ලියන මහත්වරුන් දෙදෙනා සහ කාර්යාල සේවක 04 දෙනාගේ තනතුරු "Personal to Holder" යනුවෙන් අඛණ්ඩව ඔවුන් විශ්‍රාම ගන්නා තුරු සේවය කිරීම හැර වෙනත් විකල්පයක් ගත නොහැකි වී ඇත. කෙසේ වුවත්, ඉහත කාරණා 2020 වර්ෂයේ ස්ථාන මාරු වීම් වලින් ගැලීමට කටයුතු කෙරේ.